# නූතන ජනසන්නිවේදනයෙන් පැණෙන ග්‍රාහකත්වය හා බෞද්ධ ශ්‍රාවක සංකල්පය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

ආර්. එස්. රාජපක්ෂ[1]
ජේ. ජී. ඒ. යු. නන්දසිරි[2]

## හැඳින්වීම

සන්නිවේදන ක්‍රියාවලියේ දී ග්‍රාහකයාගේ (Receiver) භූමිකාව සුවිශේෂී වූවකි. ග්‍රහකයා සාර්ථක සන්නිවේදන කාර්යයක් සඳහා පියවර කිහිපයක් ඔස්සේ දායක වේ. ඒ අනුව ඔහු සංදේශය දැකීම, ශ්‍රවණය කිරීම, ග්‍රහණය කරගැනීම, අර්ථකථනය කරගැනීම, පිළිගැනීම, ධාරණය කරගැනීම, භාවිත කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සිදුකරයි. මෙම පියවර අනුගමනය කිරීමෙන් තොරව සාර්ථක හා පරිපූර්ණ සන්නිවේදන ක්‍රියාවලියක් ඇති නොවේ. (www.grammar.about.com). ජනසන්නිවේදනයේ දී පාඨක, ප්‍රේක්ෂක, ශ්‍රාවක යනාදී සෑම පාර්ශ්වයකටම "ග්‍රාහකයා" යන යෙදුම භාවිතයට ගනී. ජනමාධ්‍යයකට නැඹුරුවන පුද්ගලයා ග්‍රාහකයෙක් ලෙස සැලකේ. යමක් ග්‍රහණය කරගැනීමට භාවිතයට ගන්නා උපකරණ ද Receiver යනුවෙන් හැඳින්වේ. (මහේන්ද්‍ර:1997;පි.259).

නූතන සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශයන්හි ග්‍රාහකයා පිළිබඳව පවත්නා විග්‍රහය ප්‍රශස්ත මට්ටමක නොපවතියි. ජනසන්නිවේදනයේ දී ඔහුගේ කාර්යය සංදේශය ලබාගැනීමේ හා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියට පමණක් සීමා වූවක් වශයෙන් දක්වා ඇත. ඒ අනුව නූතන ජනසන්නිවේදන ක්‍රියාදාමය තුළ ග්‍රාහකයාගේ කාර්යභාරය සරල විග්‍රහයකට සීමා වී තිබේ. එසේම වර්තමානයේ විවිධ තාක්ෂණික මෙවලම් හා ඒවායෙහි ක්‍රියාකාරීත්වයට අදාළව ග්‍රාහකයාගේ ස්වභාවය විවරණය කරයි. ග්‍රාහකයා පිළිබඳ පවත්නා නූතන විග්‍රහයෙන් ග්‍රාහකත්වයේ දාර්ශනික පසුබිම විවරණය වන්නේ අල්ප වශයෙනි.

භෞතික, ජීව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක සාධක ඇසුරෙන් දිගුකාලීනව පෝෂණය වෙමින් බිහිවුණ සමයාන්තර දර්ශනයක් වන බුදුදහමේ සන්නිවේදන අන්තර්ගතය පුළුල් වූවකි. බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ ඓහලෞකික, පාරලෞකික අභිමතාර්ථ සාධනය උදෙසා විවිධ ශ්‍රාවකයන්, අරමුණු, සමාජ අවස්ථා කේන්ද්‍ර කොටගෙන සාකල්‍යවාදී ප්‍රවේශයක් මත හිඳිමින් ධර්මය දේශනා කළහ. එය ව්‍යුහාත්මක සහ සංකල්පීය ප්‍රවේශයකින් හඳුනාගැනීම

---

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, saman.rajapaksha@ymail.com
[2] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, amaliprint@gmail.com

විනිශ්චය කළ යුතු ය. පෞරුෂය යනු පුද්ගලයා පිළිබඳ සමස්ත ප්‍රකාශනයකි. ශ්‍රාවකයාට යමක් ගෝචර වන්නේ ඔහුගේ පෞරුෂයේ ස්වභාවය මතයි. සන්නිවේදනයේ දී ශ්‍රාවක අභිලාෂයන් ඉටුකිරීමට මෙම විග්‍රහය උපයෝගී කරගත හැකි ය.

i. පොකුණෙහි හටගෙන එහි දිය තුළ ම ගැලී පවත්නා පියුම්, එනම් අවම වර්ධනයෙන් යුත් පෞරුෂ ඇති මිනිසුන්.

ii. පොකුණෙහි හට ගෙන එහි දිය හා සමව හෙවත් ජල මට්ටම හා සමානව පවත්නා පියුම්, එනම් මධ්‍ය වර්ධනයක් සහිත පෞරුෂ ඇති මිනිසුන්.

iii. පොකුණෙහි හටගෙන එහි මඩෙන් හා දියෙන් වෙන්ව උඩට නැගීම හෙවත් ජල මට්ටම ඉක්මවා පවත්නා පියුම්, එනම් උපරිම වර්ධනයක් සහිත පෞරුෂ ඇති මිනිසුන්.

බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයා සංදේශ අවබෝධ කරගැනීමේ සහ විග්‍රහ කරගැනීමේ ස්වභාවය අනුව පුළුල් විශ්ලේෂණයක් ඉදිරිපත් කළහ (අංගුත්තර නිකාය 2:2006;පි.260).

i. වහා අවබෝධ කරගන්නා ශ්‍රාවකයා.

ii. මඳක් විස්තර කිරීමෙන් පසුව අවබෝධ කරගන්නා ශ්‍රාවකයා.

iii. සන්දේශය සම්පූර්ණයෙන් ම විවරණය කිරීමෙන් පසුව අවබෝධ කරගන්නා ශ්‍රාවකයා.

iv. වචනය පමණක් අවබෝධ කරගන්නා නමුත් අර්ථය අවබෝධ කර නොගන්නා ශ්‍රාවකයා.

මේ සඳහා පදනම් වන්නේ ශ්‍රාවකයාගේ අවබෝධ ඥානය යි. සන්නිවේදනයේ දී සන්නිවේදකයා විසින් ශ්‍රාවකයාගේ ඥාන ධාරාව හැඳිනගත යුතු ය. ඊට යෝග්‍ය පරිදි සංදේශයන්හි අන්තර්ගතය සකස් කිරීමෙන් සාර සන්නිවේදනයකට ඉඩ සැලසේ. මෙම විග්‍රහය ශ්‍රාවකයා පිළිබඳ මනෝවිද්‍යාත්මක සහ ජීවවිද්‍යාත්මක විශ්ලේෂණයකි.

ශ්‍රාවකයාට යම් සංදේශයක් නිසි ලෙස අවබෝධ නොවීමට හේතු වන ශ්‍රාවක දුර්ගුණ පිළිබඳව අං:නි: ප්‍රථම, දෙවන හා තෙවන සම්මත්ත නියාම සූත්‍ර දේශනාවන්හි සඳහන් වේ (අංගුත්තරනිකාය 3:2006;පි.284-286). ඒ අනුව යමක් නිසි පරිදි අවබෝධ නොවීමට හේතුවන ශ්‍රාවක දුර්වලතා කිහිපයක් පහත දැක්වේ.

i. කථාවට පරිභව කිරීම.

ii. ධර්ම කථිකයාට පරිභව කිරීම.

iii. තමාට පරිභව කරගැනීම.

iv. ධර්මය එකඟ නොවූ සිත් ඇතිව වික්ෂිප්ත චිත්තයෙන් යුක්තව ශ්‍රවණය කිරීම.

v. ධර්මය නුනුවණින් (නුවණින් තොරව) මෙනෙහි කිරීම.

සන්නිවේදනයේ දී ග්‍රාහකයාට සංදේශ නිසි පරිදි අවබෝධ නොවන්නේ ඔහු මෙවැනි ශ්‍රාවක දුර්ගුණ එකකින් හෝ කිහිපයකින් පෙළීම හේතුවෙනි.

''පුද්ගලපරාවරඥ'' යනු මනෝවිද්‍යාත්මකව සහ ජීවවිද්‍යාත්මකව ශ්‍රාවකයාගේ චර්යාව හඳුනාගැනීම යි. අං:නි: ''ධම්මඤ්ඤූ'' සූත්‍රයේ ''පුද්ගලපරාවරඥ'' සංකල්පය යටතේ මානසික චර්යා මත ගොඩනැගුණ ශ්‍රාවක ප්‍රභේද කිහිපයක් හඳුනාගත හැකි ය. ශ්‍රාවක මනෝභාව මූලික කොටගෙන සිදුකෙරෙන මෙම විවරණය සමස්ත මානව සමාජයට ම පොදු වූවකි. සන්නිවේදන මාධ්‍යයේ ස්වභාවය අනුව ශ්‍රාවකත්වය වෙනස් නොවන අතර පුද්ගල මනස හා බැඳි චර්යාව මත පමණක් ශ්‍රාවකත්වය වෙනස් වන බව ධම්මඤ්ඤූ සූත්‍රයේ විග්‍රහ වේ.

## නිගමන

ශ්‍රාවකත්වය පිළිබඳ බෞද්ධ දාර්ශනික විග්‍රහය පුළුල් පරාසයක පැතිර පවතියි. ජනසන්නිවේදනයේ ග්‍රාහකත්වය මෙන් බුදුදහමේ ශ්‍රාවකත්වය මාධ්‍ය ස්වභාවය අනුව වෙනස් නොවේ. ඒ අනුව නූතන ජනසන්නිවේදනයෙහි ග්‍රාහකයා පිළිබඳව ඉදිරිපත් වී ඇති විග්‍රහයන්ට වඩා පුළුල් සමාජ, මනෝ විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක පදනමකින් යුක්තව බෞද්ධ ශ්‍රාවකත්ව සංකල්පය ගොඩනැගී ඇත.

බෞද්ධ සන්නිවේදනය ප්‍රචාරණ හෝ අලෙවිකරණ අභිප්‍රායයන් සඵල කරගැනීම පිණිස ක්‍රියාත්මක නොවන්නකි. ධර්ම සන්නිවේදනයේ දී ශ්‍රාවකයා පාරිභෝගිකයෙකු බවට පත්නොවේ. ලාභය පිණිස ශ්‍රාවකයා තරඟකාරීව හසුකරගැනීම බෞද්ධ සන්නිවේදන ප්‍රතිපදාවෙන් දෘශ්‍යමාන නොවේ.

ධර්ම සන්නිවේදනයේ ඒකායන පරමාර්ථය වන්නේ ශ්‍රාවකයාගේ ලෞකික සහ ලෝකෝත්තර දියුණුව සැලසීමයි. ඒ අනුව උපතේ සිට මරණය දක්වා ශ්‍රාවකයාගේ පැවැත්ම ආවරණය වන දාර්ශනික ඉගැන්වීම් සමුදායකින් බෞද්ධ සන්නිවේදනය සමන්විත වේ.

**ප්‍රමුඛ පද :** බෞද්ධ ශ්‍රාවක සංකල්පය, සන්නිවේදනය, ජනමාධ්‍ය, ග්‍රාහකත්වය

## ආශ්‍රිත ග්‍රන්ථ

*අංගුත්තරනිකාය* 2. (2006). චතුත්තකනිපාත. පුග්ගලවග්ග. නෙයාපුග්ගල සූත්‍රය. බු:ජ:ත්‍රි: දෙහිවල: බෞ:සං:ම.

*අංගුත්තරනිකාය* 3. (2006). පඤ්චකනිපාත. සද්ධම්මවග්ග. ප්‍රථම. දෙවන. තෙවන සම්මත්තනියාම සූත්‍ර, බු:ජ:ත්‍රි:,දෙහිවල: බෞ:සං:ම.

*මහාවග්ගපාළි* 1. (2006). විනය පිටක මහාඛන්දක, බුද්ධ ජයන්ති මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

මහේන්ද්‍ර, සුනන්ද. (1997). *සන්නිවේදන ශබ්දාකරය.* කොළඹ : ගොඩගේ

http://grammar.about.com./od/rs/g/Receiver.htm